# කොළඹ විශ්වවිද්‍යාලය

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී උපාධි දෙවන වසර පරීක්ෂණය

## දෙවන සෙමෙස්තරය - 2017/2018

## BST 2226 – සාහිත්‍ය මූලාශ්‍රය හා බෞද්ධ සම්ප්‍රදාය

(පැ දෙකයි)

ප්‍රශ්න **තුනකට (03) පමණක්** පිළිතුරු සපයන්න.

---

1. සොළී ආක්‍රමණ නිසා ඇති වූ ආගමික හා ශාස්ත්‍රීය පරිහානියෙන් ජන සමාජය ගොඩ ගැනීමට ලේඛකයන් විසින් ගනු ලැබූ ප්‍රයත්නය අදාළ එක් ග්‍රන්ථයක් ආශ්‍රයෙන් විමසන්න.

2. මිහින්තලා පුවරු ලිපිය පැරණි ලක්දිව විහාරාරාම පාලනය පිළිබඳ කවර තොරතුරු අනාවරණය කරයිද? පහදන්න.

3. පොළොන්නරු යුගයේ රචිත ග්‍රන්ථ ආශ්‍රයෙන් එකල ආගමික කේන්ද්‍රවල පැවති අධ්‍යාපනයේ ස්වරූපය පිළිබඳ කවර වැටහීමක් ලබා ගතහැකිද? විමසන්න.

4. "කර්මය සහ පුනර්භවය යන ප්‍රධාන බෞද්ධ සංකල්ප ජනයාගේ සිත් තුළට පිවිසවීම සඳහා පැරණි සිංහල ලේඛකවරුන් භාවිත කරන ලද්දේ බණකථා මාධ්‍යයයි" අදාළ එක් ග්‍රන්ථයක් ඇසුරින් ඉහත කියමන විමසන්න.

5. ත්‍රිවිධ චෛත්‍ය වන්දනාව පදනම් කරගෙන ශ්‍රී ලංකාවේ ජනයා අතර සුවිශේෂ සංස්කෘතියක් ගොඩනැගී තිබුණු බව ප්‍රකාශ කිරීමට සිංහල ග්‍රන්ථාශ්‍රයෙන් ලැබෙන ආධාරය පැහැදිලි කරන්න.

6. "ඒ ඒ අවධිවලදී බුද්ධ ශාසනය හා සම්බන්ධ නැගීම් හා බැසීම් වටහා ගැනීමට කතිකාවත්වලින් ලැබෙන්නේ නොමඳ පිටිවහලකි" නිදර්ශන සහිතව සාකච්ඡා කරන්න.

******************************